# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන)

**1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

යාපනය දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා විසින්
2016 ජනවාරි මස 27 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2015 දෙසැම්බර් මස 07 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

**[79 වන පනත් කෙටුම්පත]**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

**මිළ : රු. 6.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන)

## 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මෙම පනත 2016 අංක  දරන ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියට 28අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන) 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 28 වන වගන්තියට ඉක්බිතිව පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කිරීමෙන් එම පනත තවදුරටත් සංශෝධනය කරනු ලබන අතර ඒ වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 28අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය:—

"ඇද ගෙන යනු ලබන දැල් සහිත ධීවර මෙහෙයුම් තහනම් කිරීම.

28අ. (1) තටු දෙකක් රහිතව, එහෙත් දැලෙහි නිදහස් දෙකෙලවරෙහි සිරස් අතට රිටි භාවිතා කරන දැල් ද ඇතුළුව, ඇදගෙන යනු ලබන දැල් මගින් කරනු ලබන ධීවර මෙහෙයුම් කිසිම තැනැත්තකු විසින් නොකළ යුතු අතර, එවැනි මෙහෙයුම් සඳහා අනුබල නොදිය යුතු ය;

(2) කිසිදු තැනැත්තකු ශ්‍රී ලංකා ජල තීරයේ සිදුකරන ධීවර මෙහෙයුම් සඳහා ඇදගෙන යනු ලබන දැල් භාවිත කිරීම, සන්තකයේ තබා ගැනීම, ආනයනය කිරීම, ප්‍රවාහනය කිරීම, මිල දී ගැනීම හෝ අලෙවි කිරීම නොකළ යුතු ය;

(3) ශ්‍රී ලංකාවේ ජල තීරයේ ඇදගෙන යනු ලබන දැල් යොදා සිදු කරන ධීවර මෙහෙයුම් සඳහා ප්‍රධාන ප්‍රඥප්තියේ II කොටස යටතේ කිසිදු තැනැත්තකුට බලපත්‍ර නිකුත් නොකළ යුතු ය;

(4) ශ්‍රී ලංකාවේ ජල තීරයේ ඇදගෙන යනු ලබන දැල් යොදා සිදු කරන ධීවර මෙහෙයුම් සඳහා දැනට නිකුත් කර ඇති සියලුම බලපත්‍ර නැවත අලුත් නොකළ යුතු අතර බලපත්‍ර අලුත් කිරීම සඳහා ඉදිරිපත් වන්නා වූ අයදුම්පත් භාර නොගත යුතු ය:

එසේ වුව ද, ඇදගෙන යනු ලබන දැල් භාවිතයට දැනටමත් නිකුත් කර ඇති හා මෙම පනත බලාත්මක වන දිනට පෙර දින වලංගුව පැවති බලපත්‍රයක් මෙම පනතෙහි කුමක් සඳහන්ව ඇතත් බලපත්‍රය නිකුත් කරන ලද අරමුණට අනුකූලව, බලපත්‍රයෙහි නිර්දේශිත කාල සීමාව සඳහා අඛණ්ඩව වලංගු වෙයි.”.

ප්‍රධාන ප්‍රඥප්තියට 49(7) අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියෙහි 49(6) වැනි වගන්තියට ඉක්බිතිව පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කිරීමෙන් එම ප්‍රධාන ප්‍රඥප්තිය තවදුරටත් සංශෝධනය කරනු ලබන අතර, ඒ වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 49(7) වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය.

“වැරදි.

49 (7). මෙම පනතේ 28අ වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන හෝ ඒ හා අනුකූලවීම පැහැරහරින යම් තැනැත්තකු වරදක් සිදුකරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට දී පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී එම තැනැත්තා වසර දෙකකට නොවැඩි කාලසීමාවක් සඳහා වන බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් පනස් දහසකට නොඅඩු දඩ මුදලක් ගෙවීමකට හෝ යටත් විය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 66 වන වගන්තිය සංශෝධනය කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තියෙහි ඇතුළත් “ශ්‍රී ලංකා ජල තීරය” යන නිර්වචනයට පසු පහත සඳහන් නිර්වචනයන් ඇතුළත් කිරීමෙන් එම ප්‍රධාන ප්‍රඥප්තිය සංශෝධනය කරනු ලැබේ:—

“ඇදගෙන යනු ලබන දැල” යනුවෙන් හඳුන්වනු ලබන්නේ කේතුවක හැඩය ගත් දැල් කඳක සිහින් කෙලවරට මඩියක් සම්බන්ධ කර ඇති, අනෙක් කෙලවරෙහි දෙපසට තටු දෙකක් සම්බන්ධ කර ඇති හෝ නැති දැල් විශේෂයකි.

"ඇද ගෙන යනු ලබන දැල් යොදා සිදුකරන ධීවර මෙහෙයුම්" යනුවෙන් හඳුන්වනු ලබන්නේ ජල පත්ලෙන් හෝ ජලය තුළින් යාන්ත්‍රිකව දැලක් ඇදගෙන යාම මගින් සිදු කරනු ලබන ධීවර මෙහෙයුමකි.

අනනුකූලතාවක් ඇති වූ, විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

**5.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.